# 6 ගනුදෙනුවල ද්විත්ව බලපෑම



මෙම පරිච්ඡේදය මගින් පහත දැක්වෙන කරුණු පිළිබඳ ව සාකච්ඡා කෙරේ.

6.1 ගනුදෙනුවල ද්විත්ව බලපෑම හැඳින්වීම

6.2 ද්විත්ව සටහන් ක්‍රමය

6.3 ගිණුම

6.4 ගිණුම් වර්ග

6.5 ගනුදෙනු ගිණුම්වල සටහන් කිරීම



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## 6.1 ගනුදෙනුවල ද්විත්ව බලපෑම

ව්‍යාපාරයක දෛනික ව ගනුදෙනු රාශියක් සිදු වේ. එම ගනුදෙනුවල ප්‍රතිඵල වශයෙන් ව්‍යාපාරයේ වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම් හා වියදම්වල අගය වෙනස් වේ. එම වෙනස් වීම ගනුදෙනුවක ද්විත්ව බලපෑම ලෙස ගිණුම්කරණයේ දී හඳුනා ගැනේ.

සෑම ගනුදෙනුවකින් ම ගිණුම්කරණ සමීකරණයේ අයිතම දෙකක් වෙනස් වන බව ඉහත දී පැහැදිලි කරන ලදි. ඒ සෑම ගනුදෙනුවක් ම සමීකරණයේ අයිතම දෙකකට බලපායි. එය ගනුදෙනුවක ද්විත්ව බලපෑම ලෙස හඳුනාගත හැකි ය.

**නිදසුන් :-**

| | | |
|---|---|---|
| ප්‍රාග්ධනය යෙදවීමෙන් | මුදල් වැඩි වේ | හිමිකම වැඩි වේ |
| ලී බඩු මිලදී ගැනීමෙන් | ලී බඩු වැඩි වේ | මුදල් අඩු වේ |
| වැටුප් ගෙවීමෙන් | මුදල් අඩු වේ | හිමිකම අඩු වේ |

මෙසේ සෑම ගනුදෙනුවකින් ම සමීකරණයට ද්විත්ව බලපෑමක් සිදුවන නිසා සෑම ගනුදෙනුවක ම අගය ස්ථාන දෙකක ලිවිය යුතු ය. එනම් සෑම ගනුදෙනුවක් සඳහා ම සටහන් දෙකක් තැබිය යුතු ය. ව්‍යාපාරයක් ප්‍රසාරණය වන විට විශාල ගනුදෙනු ප්‍රමාණයක් සිදුවන බැවින් ඒවා ගිණුම්කරණ සමීකරණයක අනුසාරයෙන් ඉදිරිපත් කිරීම ප්‍රායෝගික නොවිය හැකි ය. එසේ සටහන් කළ ද ව්‍යාපාරය පිළිබඳ පැහැදිලි තොරතුරු ලබා ගැනීම අපහසු වේ. මේ නිසා එම ගනුදෙනුවල ද්විත්ව බලපෑම ගිණුම්කරණයේ දී සාමාන්‍යයෙන් සටහන් කරනු ලබන්නේ ද්විත්ව සටහන් ක්‍රමය අනුව ය.

## 6.2 ද්විත්ව සටහන් ක්‍රමය

සෑම ගනුදෙනුවකින් ම ගිණුම්කරණ සමීකරණට ද්විත්ව බලපෑමක් සිදුවන බවත් එම බලපෑම සටහන් කරන්නේ ගිණුම්වල බවත් ඉහත දී සඳහන් කර ඇත. එසේ ගනුදෙනුවක ද්විත්ව බලපෑම සටහන් කරන විට එකම වටිනාකම වෙනමම ගිණුම් දෙකක සටහන් කිරීමට සිදු වේ. සෑම ගිණුමක ම හර සහ බැර වශයෙන් දෙපැත්තක් ඇත. කිසියම් ගනුදෙනුවක වටිනාකම එක් ගිණුමක හර පැත්තේ සටහන් කළ හොත් තවත් ගිණුමක බැර පැත්තේ සටහන් කළ යුතු ය. මෙසේ ගනුදෙනුවක ද්විත්ව බලපෑම පෙන්නුම් කිරීම සඳහා එක ම වටිනාකම වෙනුවෙන් හර සහ බැර වශයෙන් සටහන් ඇතිවන පරිදි ගිණුම් තැබීමේ ක්‍රමය ද්විත්ව සටහන් ක්‍රමය වේ.

## 6.3 ගිණුම

කාලච්ඡේදයක් තුළ වත්කමක, හිමිකමක, වගකීමක, ආදායමක, හෝ වියදමක සිදුවන වෙනස්වීම (අඩු වීම හෝ වැඩි වීම) වාර්තා කරනු ලබන පොදුවේ පිළිගත් ආකෘතිය ගිණුමක් වේ. ගිණුමක් පහත සඳහන් ආකාරයට පිළියෙල කළ හැකි ය.

හර ............................ ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

(1) සහ (5) ගනුදෙනුව සිදු වූ දිනය
(2) සහ (6) ද්විත්ව සටහනේ අනෙක් සටහන තැබූ ගිණුමේ නම
ගිණුමක හර පැත්තේ ඇති විස්තරය තීරුවේ සාමාන්‍යයෙන් ලියන්නේ අදළ වටිනාකම බැර කරන ගිණුමේ නම වන අතර
ගිණුමක බැර පැත්තේ ඇති විස්තරය තීරුවේ සාමාන්‍යයෙන් ලියන්නේ අදළ වටිනාකම හර කරන ගිණුමේ නම යි.
(3) සහ (7) ගනුදෙනුවේ අනෙක් සටහන දක්වෙන ගිණුම ඇතුළත් වන ලෙජරය නැමැති පොතෙහි ඇති පිටුවේ අංකය. (සඟල පිටු අංකය)
(4) සහ (8) ගනුදෙනුවේ වටිනාකම

## 6.4 ගිණුම් වර්ග

ව්‍යාපාර ගනුදෙනු නිසා වත්කම්, හිමිකම, වගකීම්, ආදයම්, හා වියදම් ජනිත වන බව අප මීට පෙර සාකච්ඡා කරන ලදි. ගනුදෙනු නිසා මෙම අයිතමවල සිදුවන වෙනස්වීම් වාර්තා කිරීමට ගිණුම් යොදා ගනී. මෙම සියලු ම ගිණුම් වර්ග පහක් යටතේ හඳුනා ගත හැකි ය.

01. වත්කම් ගිණුම්
**නිදසුන් ඃ-**
ගොඩනැගිලි ගිණුම, ණයගැති ගිණුම
මුදල් ගිණුම

02. වගකීම් ගිණුම්
**නිදසුන් ඃ-**
බැංකු ණය ගිණුම, ණය හිමි ගිණුම
ගෙවිය යුතු විදුලි ගාස්තු ගිණුම

03. හිමිකම් ගිණුම
**නිදසුන් ඃ-**
ප්‍රාග්ධන ගිණුම, ගැනිලි ගිණුම

04. ආදයම් ගිණුම්
**නිදසුන් ඃ-**
විකුණුම් ගිණුම, කොමිස් ආදයම් ගිණුම
පොලී ආදයම් ගිණුම

05. වියදම් ගිණුම්
**නිදසුන් ඃ-**
වැටුප් ගිණුම, රක්ෂණ ගාස්තු ගිණුම,
විදුලි ගාස්තු ගිණුම



රූපය 6.1

ව්‍යාපාර ගනුදෙනු ගිණුම්වල සටහන් කරන විට ගනුදෙනුවේ වටිනාකම අදාළ ගිණුම්වල හර පැත්තේ හෝ බැර පැත්තේ සටහන් කළ යුතු ය. එසේ සටහන් කරන ආකාරය පිළිබඳ ව සලකා බලමු.

## 6.5 ගනුදෙනු ගිණුම්වල සටහන් කිරීම

ගිණුම්වල සටහන් කෙරෙන්නේ වත්කමක, හිමිකමක, වගකීමක, ආදායමක, හෝ වියදමක වැඩි වීම හෝ අඩු වීම ය. කෙසේ වුව ද ගිණුමකට හර කරන්නේ වැඩිවීමක් පෙන්නුම් කිරීම සඳහා ම නොවේ. සමහර ගිණුම්වල වැඩි වීමක් පෙන්නුම් කිරීම සඳහා හර කරනු ලබන අතර සමහර ගිණුම්වල අඩු වීමක් පෙන්නුම් කිරීම සඳහා ද හර කරනු ලැබේ. බැර කිරීම සම්බන්ධයෙන් ද තත්ත්වය මෙසේ ම ය. ඒ අනුව වැඩි වීම හෝ අඩු වීම පෙන්නුම් කිරීම සඳහා ගිණුමක හර හෝ බැර කරන්නේ කෙසේ ද යන ගැටලුව පැන නගියි. මෙම ගැටලුවට විසඳුම් ලෙස පොදුවේ පිළිගත් රීති සමූහයක් ඇත. ද්විත්ව සටහන් රීතීන් හෙවත් ද්විත්ව සටහන් මූලධර්ම ලෙස හැඳින්වෙන්නේ මේවා ය. ගිණුම් වර්ග පහක් සඳහා ද්විත්ව සටහන් රීතී පහක් තිබේ. ඒවා පහත වගුවේ දක්වා ඇත.




| ගිණුම් වර්ගය | වැඩි වීම | අඩු වීම |
|---|---|---|
| වත්කම් ගිණුම් | හර | බැර |
| වගකීම් ගිණුම් | බැර | හර |
| හිමිකම් ගිණුම් | බැර | හර |
| ආදායම් ගිණුම් | බැර | හර |
| වියදම් ගිණුම් | හර | බැර |




රූපය 6.2

**නිදසුන් :-** 20XX.01.03 රු. 500 000ක් ගෙවා යන්ත්‍රයක් මිල දී ගැනීම

ද්විත්ව සටහන :- යන්ත්‍ර ගිණුම (වත්කම් වැඩි වීම) හර රු. 500 000

මුදල් ගිණුම (වත්කම් අඩු වීම) බැර රු. 500 000

හර     යන්ත්‍ර ගිණුම     බැර

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.01.03 | මුදල් ගිණුම | | 500 000 | | | | |

හර     මුදල් ගිණුම     බැර

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 20XX.01.03 | යන්ත්‍ර ගිණුම | | 500 000 |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**නිදසුන් :-** 20XX.01.04 ව්‍යාපාරයට රු. 200 000ක බැංකු ණයක් ලබා ගැනීම

ද්විත්ව සටහන :- මුදල් ගිණුම (වත්කම් වැඩි වීම) හර රු. 200 000

බැංකු ණය (වගකීම් වැඩි වීම) බැර රු. 200 000

හර මුදල් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.01.03 | බැංකු ණය ගිණුම | | 200 000 | | | | |

හර බැංකු ණය ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 20XX.01.03 | මුදල් ගිණුම | | 200 000 |

**නිදසුන් :-** 20XX.01.05 අයිතිකරු ව්‍යාපාරයට රු. 300 000ක මුදල් යෙදවීම

ද්විත්ව සටහන :- මුදල් ගිණුම (වත්කම් වැඩි වීම) හර රු. 300 000

ප්‍රාග්ධන ගිණුම (හිමිකම වැඩිවීම) බැර රු. 300 000

හර මුදල් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.01.05 | ප්‍රාග්ධන ගිණුම | | 300 000 | | | | |

හර ප්‍රාග්ධන ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 20XX.01.05 | මුදල් ගිණුම | | 300 000 |

**නිදසුන් :-** 20XX.01.05 රු. 200 000ක පොලී ආදයමක් ලැබීම

ද්විත්ව සටහන :- මුදල් ගිණුම (වත්කම් වැඩි වීම) හර රු. 200 000

පොලී ආදයම් ගිණුම (ආදායම් වැඩිවීම) බැර රු. 200 000

හර මුදල් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.01.05 | පොලී ආදයම් ගිණුම | | 200 000 | | | | |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

හර පොලී ආදායම් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 20XX.01.05 | මුදල් ගිණුම | | 200 000 |

**නිදසුන් :-** 20XX.01.06 රු. 20 000ක වැටුප් ගෙවීම

ද්විත්ව සටහන :- වැටුප් ගිණුම (වියදම් වැඩි වීම) හර රු. 20 000
මුදල් ගිණුම (වත්කම් අඩු වීම) බැර රු. 20 000

හර වැටුප් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.01.06 | මුදල් ගිණුම | | 20 000 | | | | |

හර මුදල් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 20XX.01.06 | වැටුප් ගිණුම | | 20 000 |

## ලෙජරය

ව්‍යාපාරයක එක් එක් වත්කම් වර්ගය වෙනුවෙන් වෙන වෙන ම ගිණුම බැගින් පවත්වාගෙන යා යුතුය. ඒ අනුව මෝටර් රථ ගිණුම, ලී බඩු ගිණුම, මුදල් ගිණුම යනාදී වශයෙන් වත්කම් ගිණුම් ගණනාවක් ම තිබිය හැකි ය. මේ ආකාරයට හිමිකම්, වගකීම්, ආදායම් හා වියදම් යනාදිය සඳහා ද ගිණුම් ගණනාවක් තිබිය හැකි ය. මෙම ගිණුම් සියල්ලෙහි ම එකතුව **ලෙජරය** ලෙස හඳුන්වනු ලැබේ. මේ නිසා ව්‍යාපාර ගනුදෙනු ගිණුම්වල සටහන් කිරීම ඒවා ලෙජරයෙහි සටහන් කිරීම ලෙස ද හැඳින්විය හැකි ය.



රූප 6.3



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

### *ක්‍රියාකාරකම 01*

ද්විත්ව සටහන් මූලධර්මයට අනුව, පහත දක්වා ඇති එක් එක් ගිණුම්වල අගයන්හි වැඩිවීම හෝ අඩුවීම සටහන් කරනු ලබන්නේ හර පැත්තේ ද නැතහොත් බැර පැත්තේ ද යන්න සටහන් කරන්න.

| අනු අංකය | ගිණුමේ නම | වැඩිවීම | අඩුවීම |
|---|---|---|---|
| 1 | ගොඩනැගිලි ගිණුම | | |
| 2 | බැංකු ණය ගිණුම | | |
| 3 | විකුණුම් ගිණුම | | |
| 4 | විදුලි ගාස්තු ගිණුම | | |
| 5 | ලැබූ පොලී ගිණුම | | |
| 6 | මෝටර් රථ ගිණුම | | |
| 7 | ගැනුම් ගිණුම | | |
| 8 | ප්‍රාග්ධන ගිණුම | | |
| 9 | ගැනිලි ගිණුම | | |
| 10 | ණය ගැති ගිණුම | | |

### *ක්‍රියාකාරකම 02*

පහත දක්වා අත්තේ ව්‍යාපාරයක 20xx මාර්තු මාසය තුළ සිදු වූ ගනුදෙනු ය. එම එක් එක් ගනුදෙනුව සඳහා ද්විත්ව සටහන් ලියා දක්වන්න.

මාර්තු 01 අයිතිකරු රු. 200 000ක ප්‍රාග්ධනයක් යෙදවීම
02 රු. 50 000ක භාණ්ඩ තොගයක් අත්පිට මුදලට ගැනීම
03 රු. 10 000ක්වූ ව්‍යාපාරයේ මාසික කුලිය ගෙවීම
04 රු. 70 000කට භාණ්ඩ අත්පිට විකිණීම
05 රු. 80 000ක භාණ්ඩ ණයට ගැනීම
06 රු. 10 000ක් අයිතිකරුගේ පෞද්ගලික පරිහරණයට ගැනීම
07 රු. 20 000ක් වූ මාසික වැටුප් ගෙවීම
08 රු. 200 000ක බැංකු ණයක් ලබා ගැනීම
09 රු. 10 000ක ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම
10 රු. 60 000කට භාණ්ඩ ණයට විකිණීම

### ක්‍රියාකාරකම 03

නාමල්ගේ ව්‍යාපාරයේ 20xx ජනවාරි මස තුළ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දක්වා ඇත.

| | | |
|---|---|---|
| ජනවාරි | 01 | රු. 300 000ක ප්‍රාග්ධනය යෙදවීම |
| | 02 | ව්‍යාපාරයේ පරිහරණය සඳහා රු. 50 000ක උපකරණ මිලදී ගැනීම |
| | 03 | රු. 80 000ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම |
| | 04 | අයිතිකරුගේ නිවසේ රු. 5 000ක දුරකථන බිල ව්‍යාපාරයේ මුදලින් ගෙවීම |
| | 05 | රු. 50 000ක භාණ්ඩ අත්පිට මුදලට විකිණීම |
| | 06 | රු. 7 000ක රක්ෂණ ගාස්තු ගෙවීම |
| | 07 | රු. 40 000ක භාණ්ඩ තොගයක් මිලදී ගැනීම |
| | 08 | රු. 20 000ක මුදල් ණය හිමියන්ට ගෙවීම |

ඉහත සඳහන් ගනුදෙනු ගිණුම්ගත කරන්න.

### ක්‍රියාකාරකම 04

සමීරගේ ව්‍යාපාරයේ ගිණුම් ලිපිකරු විසින් 20xx ජනවාරි මාසයේ සිදු වූ ගනුදෙනු ඇතුළත් කොට පහත දක්වෙන මුදල් ගිණුම පිළියෙල කර ඇත.

හර මුදල් ගිණුම බැර

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස. පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| ජන. 01 | ප්‍රාග්ධන ගිණුම | | 80 000 | ජන. 09 | ගැනුම් ගිණුම | | 50 000 |
| 06 | විකුණුම් ගිණුම | | 60 000 | 12 | උපකරණ ගිණුම | | 80 000 |
| 07 | බැංකු ණය ගිණුම | | 100 000 | 15 | විදුලි වියදම් ගිණුම | | 10 000 |
| 27 | පොලී ආදයම් ගිණුම | | 12 000 | 18 | ආයෝජන ගිණුම | | 40 000 |
| 30 | ණයගැති ගිණුම | | 4 000 | 22 | බැංකු ණය පොලී | | 10 000 |
| | | | | 25 | ණය හිමි ගිණුම | | 5 000 |

අවශ්‍ය වන්නේ :-

1. ඉහත මුදල් ගිණුමේ සටහන් කරන ලද ගනුදෙනු මොනවා ද යන්න දින පිළිවෙළ අනුව ඉදිරිපත් කරන්න.
2. ඉහත ගනුදෙනුවලට අදාළ අනෙකුත් සටහන් සමීරගේ ව්‍යාපාරයේ ලෙජරයේ සටහන් කර ඇති ආකාරය දක්වන්න.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.